# පොලිස් මාධ්‍ය කොට්ඨාසය
## பொலிஸ் ஊடகப் பிரிவு
## POLICE MEDIA DIVISION
සෙත්සිරිපාය, බත්තරමුල්ල

තැ.පෙ.අංකය / த. பெ.இ / Po.Box No – 10120

ෆැක්ස් / தொலைநகல / Fax – 011-2171635

දුරකථන / தொலைபேசி / Telephone – 011-2887973 (HUNTING)

වෙබ්.ලිපිනය / இணையதளம் / Web Site – www.Police.lk

ඊ මේල් / மின்னஞ்சல் / E-mail – dir.media@police.gov.lk


මගේ අංකය / எனது இலக்கம் / My NO – 1414 /2023

ඔබේ අංකය / உமது இலக்கம் / Your No – / 2023

දිනය / திகதி / Date – 12/11/2023 පැය 1000

**මාධ්‍ය නිවේදනය**

## නොමඟ යවන සුළු දුරකථන ඇමතුම්වලට හසු නොවන ලෙස පොලිසිය මහජනතාවගෙන් ඉල්ලා සිටී.

2023.11.07 වන දින වෛද්‍යවරයෙකු බව පවසමින් පුද්ගලයෙකු වෙත දුරකථන ඇමතුමක් ලබාදී ඔහුගේ පුතා අසනීප තත්ත්වයක් හේතුවෙන් රෝහල් ගතකල බවත්, දරුවාට හදිසි ශල්‍ය කර්මයක් සිදු කිරීමට අවශ්‍ය බවත්, ඒ සඳහා වහාම රුපියල් ලක්ෂ 02ක මුදලක් බැංකු ගත කරන ලෙසට ගිණුම් අංකයක් ලබා දෙමින් වෛද්‍යවරයා ලෙස පෙනී සිටි පුද්ගලයා දන්වා ඇත. දුරකථන ඇමතුම ලද පුද්ගලයා විසින් දුරකථන මාර්ගයෙන් ඔහුගේ පුතා සම්බන්ධ කරගෙන මේ සම්බන්ධව විමසීමේදී ඔහුට කිසිදු අසනීප තත්ත්වයක් නොමැති බවත් රෝහල් ගත නොවූ බවටත් දැනුම් දීමෙන් පසු මෙය ව්‍යාජ දුරකථන ඇමතුමක් බවට තහවුරු වීමෙන් අනතුරුව ඔහු ඒ සම්බන්ධව 2023.11.07 වන දිනම සීදූව පොලිස් ස්ථානය වෙත පැමිණිල්ලක් ඉදිරිපත් කර ඇත.

තවද මීට මාස කිහිපයකට පෙර සීදූව පොලිස් වසමේ පදිංචි තවත් පුද්ගලයෙකුට නාඳුනන පුද්ගලයෙකු විසින් දුරකථන ඇමතුමක් ලබාදෙමින් ඔහුගේ දරුවා පාසලේදී හෘද ආබාධයක් හේතුවෙන් පුද්ගලික රෝහලකට ඇතුලත් කළ බවත්, දරුවාට හදිසි සැත්කමක් සිදුකිරීමට අවශ්‍ය බැවින් රුපියල් ලක්ෂයක මුදලක් රැගෙන අදාල රෝහල වෙත පැමිණිය හැකිද යන්න විමසීමක් සිදුකර ඇත. අනතුරුව දරුවාගේ පියා විසින් මේ සම්බන්ධව වෛද්‍යවරයා සමඟ සාකච්ඡා කළ යුතු බව පවසා පසුව ඇමතුමක් ලබා ගන්නා බව සඳහන් කරමින් දුරකථනය විසන්ධි කර ඇත. ඉන් අනතුරුවද අදාල නාඳුනන පුද්ගලයා විසින් නැවත අවස්ථා කිහිපයකදී දුරකථන ඇමතුම් ලබා දී ඇත. එම ඇමතුම්වලට ඔහු විසින් ප්‍රතිචාර දක්වා නොමැති අතර, මෙම ඇමතුම ව්‍යාජ ඇමතුමක් බවට ඔහු විසින් තහවුරු කරගෙන ඇත.

ඇතැම් අවස්ථාවලදී රිය අනතුරක් සිදුව ඇති බවත්, එසේ නොමැති නම් යම් ආකාරයක ක්ෂණික ප්‍රතිකාර අවශ්‍ය බරපතල අනතුරක් සිදුව ඇති බවට ඔවුන්ගේ ළඟම ඥාතීන්ට ඇමතුම් ලබාදී එම ඥාතීන්ගෙන් මෙන්ම, ආයතන ප්‍රධානීන් අනතුරට ලක්ව ඇති බවට පවසමින් අදාල ආයතනයේ සේවකයන්ගෙන් පවා බැංකු ගිණුම්වලට මුදල් තැන්පත් කරන ලෙසට දුරකථන ඇමතුම් ලබාදෙන පුද්ගලයන් පිළිබඳව ද වාර්තා වී ඇත.

මෙම වංචනික පුද්ගලයන් විසින් විවිධ පුද්ගලයන්ගේ ජංගම දුරකථනවලට, ඔවුන් කලබලයට පත්වන ආකාරයේ ව්‍යාජ ඇමතුම් ලබා දෙමින් මෙවැනි ආකාරයට මුදල් ඉපයීමේ ජාවාරම්වල නිරතව සිටින බවට ඉහත සිදුවීම් වලට අමතරව තවත් තොරතුරු වාර්තා වෙමින් පවතී. ඇතැම් පුද්ගලයින් විසින් මෙවැනි වංචනික ක්‍රියාවන්ට හසුව එම ඇමතුම් ලබාදෙන පුද්ගලයන් විසින් පවසා සිටින බැංකු ගිණුම් වෙත කිසිදු සොයා බැලීමකින් තොරව ක්ෂණිකව විවිධ වටිනාකමින් යුත් මුදල් තැන්පත් කළ අවස්ථාවන්ද වාර්තා වී ඇත.

කරුණු එසේ හෙයින් වංචනික පුද්ගලයින් හෝ කණ්ඩායම් විසින් මෙලෙස පුද්ගලයින් රැවටීමට ලක්කරන ආකාරයට ලබාදෙන ව්‍යාජ දුරකථන ඇමතුම්වලට හෝ එම ආකාරයේ වෙනත් සමාන ක්‍රියාවන්ට හසුව තම මුදල් හෝ වටිනා දේපල කිසිදු අවස්ථාවක ඔවුන් වෙත ලබා නොදෙන ලෙස පොලීසිය අවධාරණය කර සිටි.

එසේම මෙවැනි ඇමතුම් සම්බන්ධව තිබෙන තොරතුරු පොලිසිය වෙත ලබාදිය හැකි අතර, එසේ ලැබුණු තොරතුරු පිළිබඳ විමර්ශන පවත්වා සැකකරුවන් අත්අඩංගුවට ගැනීම් ද, ඔවුන්ට එරෙහිව නීතිය ක්‍රියාත්මක කිරීමටද කටයුතු කර ඇත. එබැවින් එවැනි දුරකථන ඇමතුම් පිළිබඳ විමසිලිමත්ව හා අවබෝධයෙන් කටයුතු කරන ලෙසට පොලිසිය මහජනතාවගෙන් වැඩිදුරටත් ඉල්ලා සිටී.

නීතිඥ නිහාල් තල්දූව,
ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරී,
පොලිස් මාධ්‍ය ප්‍රකාශක.